1st Place Winner
National Productivity
Award 2020

ISO/IEC 17021
QMS-001-01

ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
பிரதான செயலாளர் அலுவலகம் – தென் மாகாணம்
CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE

මගේ අංකය எனது இல. My Ref.	CSS/07/01/03	ඔබේ අංකය உமது இல Your Ref.		දිනය திகதி Date	2026.10.09

ප්‍රධාන ලේකම් චක්‍රලේඛ (මුදල්) - **02/2026 (II)**

දකුණු පළාත් සභාවේ සියලුම
ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් හා
ගණන්දීමේ නිලධාරීන් වෙත.

<u>ඇස්තමේන්තු සකස් කිරීමේ සීමා, අනුමත කිරීමේ සීමා සහ ගිවිසුම්වලට එළැඹීමේ සීමා සංශෝධනය කිරීම</u>

දකුණු පළාත් සභාවට අයත් ආයතනවල ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම, නිර්දේශ කිරීම හා අනුමත කිරීමේ බලතල විමධ්‍යගත කිරීම සඳහා නිකුත් කර ඇති 2019.12.27 දිනැති 11/2019, 2020.03.05 දිනැති 11/2019 (I) සහ 2020.11.18 දිනැති 11/2019 (II) අංක දරන ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛ අවලංගු කරමින්, 2026.05.14 දිනැතිව නිකුත් කරන ලද ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛ 02/2026 සහ 2026.06.02 දිනැතිව නිකුත් කරන ලද ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛ 02/2026 (I) හා බැදේ.

02. ඒ අනුව, ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛ **02/2026** හි **<u>02 ඡේදය යටතේ වන වගුවේ අනු අංක 6</u>** පහත පරිදි සංශෝධනය කරමි.

6	මිලියන 3.5 දක්වා	ශ්‍රී. ලං.තා.සේ. පුහුණු/ III/ II/ I/ විශේෂ පන්තියේ නිලධාරීන්	ශ්‍රී. ලං.තා.සේ. II/ I/ පන්තියේ නිලධාරීන් • II/ I/ පන්තියේ තාක්ෂණ නිලධාරීන් නොමැති පළාත් පාලන ආයතනවල පුහුණු ශ්‍රේණිය සහ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරීන්ට ඉටු කළ හැකි ය. • **එක් තාක්ෂණ නිලධරයෙකු පමණක් සිටින දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ/ පළාත් පාලන ආයතනවල, එම තාක්ෂණ නිලධරයා විසින් සකසන ඇස්තමේන්තු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂව/ පළාත් පාලන ආයතන ප්‍රධානියාට සෘජුව ම අනුමත කළ හැකි ය.**	පළාත් පාලන ආයතන ප්‍රධානී/ ආයතන ප්‍රධානී/ දෙපාර්තමේන්තු ප්‍රධානී/ අමාත්‍යාංශ ලේකම් • **තම ආයතන වෙත සේවය සැපයීම සඳහා ශ්‍රී. ලං.තා.සේ. (විශේෂ) නිලධරයෙක් අනුයුක්තව**

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary: 091 4944002
කාර්යාලය / காரியாலயம் / Office: 091 4119011, 091 2234052
ෆැක්ස් / தொலைநகல் / Fax: 091 2246299
විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail: chiefsec1@sltnet.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Web site: www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.

"සෞභාග්‍යමත් දකුණු පළාතක්"

				සිටින්නේ නම්, එම නිලධරයාගේ නිර්දේශය මත මෙම සීමාව ඉක්මවා මිලියන 5 දක්වා අනුමත කිරීම සිදු කළ හැකි ය.

03. ප්‍රධාන ලේකම් (මුදල්) චක්‍රලේඛ 02/2026 අනුගමනය කරනු ලබන සෑම අවස්ථාවක දී ම, ඊට සමගාමී ව මෙම චක්‍රලේඛය ද අනුගමනය කිරීමට වග බලාගත යුතු ය.

චන්දිම සී. මුහන්දිරම්ගේ
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

චන්දිම සී. මුහන්දිරම්ගේ
ප්‍රධාන ලේකම්
දකුණු පළාත

පිටපත් : 1. ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති, දකුණු පළාත. - දැ.ගැ.පි.
2. නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා), දකුණු පළාත. - දැ.ගැ.පි. සහ අ.ක.ස.
3. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත. - දැ.ගැ.පි.

දුරකථන : 091-49 44 007 **ෆැක්ස් : 091-22 32 691** **විද්‍යුත් තැපැල : depoffinance7@gmail.com**